**යාපනය විශ්වවිද්‍යාලය - 2017**

**-------------------------------------**

යාපනය විශ්වවිද්‍යාලයේ (“විශ්වවිද්‍යාලය”) 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හා අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්ව විද්‍යාල පනතේ 107 (5) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උපවගන්තිය ප්‍රකාරව විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්ව විද්‍යාල පනතේ 108 (11) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාවක් 2018 සැප්තැම්බර් 17 දින විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයා වෙත නිකුත් කරන ලදී.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට ( ISSAI 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්ව විද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ III වගන්තියෙන් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

----------------

**2.1 තත්ත්වාගණනය කළ මතය**

------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට යාපනය විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

-----------------------------------------

**2.2.1 ගිණුම්කරණ අඩුපාඩු**

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගොඩනැගිලි හිමිකරු සඳහා ගෙවන ලද රු.225,000 ක් වූ කුලිය කුලී ගිණුමට හර කරනු වෙනුවට කුලී තැන්පතු ගිණුමට සාවද්‍යාව අයකර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස වර්ෂය සඳහා වියදම හා 2017 දෙසැම්බර් 31 දිනට කුලී තැන්පතු ගිණුම සමාන මුදලකින් අඩුවෙන් දක්වා තිබුණි.

(ආ) 2013 වර්ෂයේ සිට ස්වයං මූල්‍යයන පාඨමාලා ආදායම් ගිණුමක රු.184,853 ක හර ශේෂයක් දැක්වුණි. කෙසේ වුවද, මෙම ගිණුම නිරවුල් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2015 සිට 2017 දක්වා කාලපරිච්ඡේදය තුළ නිමකරන ලද රු.22,245,263 ක් වටිනා විදුලි සැපයුම් වැඩ ගිණුම්ගත කර නොතිබුණි. ගිණුම්වල ඒ වෙනුවෙන් රු.1,700,000 ක් වූ ක්ෂය සඳහා ප්‍රතිපාදනය කර තිබුණි.

**2.2.2 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

-----------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතුව රු.629,750 ක් වූ ආපසු ගෙවිය යුතු තැන්පතු 10 ක් වර්ෂ 8 කට වැඩි කාලයක් නිරවුල් කිරීමට කටයුතු කිරීමෙන් තොරව පොදු තැන්පතු ගිණුමේ රඳවා තිබුණි.

(ආ) එකතුව රු.534,808 ක් වූ ගෙවිය යුතු ශේෂ 5 ක් නිරවුල් කිරීම සඳහා අර්ථවත් ක්‍රියාමාර්ග ගැනීමෙන් තොරව 2018 සැප්තැම්බර් 30 වන විටත් වර්ෂ 8 කට වැඩි කාලයක් විවිධ ණයහිමියන් යටතේ දක්වා තිබුණි.

(ඇ) එකතුව රු.948,005 ක් වූ හිඟහිටි සේවක ණය ශේෂ වර්ෂ 5 කට වැඩි කාලයක් අයකර ගැනීමෙන් තොරව පැවතුණි.

(ඇ) විවිධ කාර්යයන් සඳහා පාර්ශව 05 කට ලබාදුන් එකතුව රු.443,485 ක් වූ අත්තිකාරම් ඔවුන් විසින් වර්ෂ 1 සිට වර්ෂ 5 දක්වා කාලයක් නිරවුල් කර නොතිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

රු.58,562,916 ක් වටිනා පුස්තකාල පොත් සම්බන්ධයෙන් වාර්ෂික සමීක්ෂණ මණ්ඩල වාර්තා විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

## 2.3 රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

විගණනයේදී නිරීක්ෂණය වූ අනුකූල නොවීම් අවස්ථා පහත දැක්වේ.

| | රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (i) | 2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | කෘෂිකර්ම පීඨය, විද්‍යා පීඨය, රාමනාදන් ලලිත කලා අධ්‍යයන ආයතනය, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨය සහ සිද්ධ ඖෂධ ඒකකයේ සවිකරන ලද ඇඟිලි සලකුණු ස්කෑනර් යන්ත්‍ර 5 ක් වර්ෂ 02 කට වැඩි කාලයක් ක්‍රියා විරහිතව පැවතුණි. කෙසේ වුවද, සියලු සේවකයන් තම පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු ස්කෑනර් යන්ත්‍රයේ සටහන් කළ යුතු වුවද එම යන්ත්‍ර අළුත්වැඩියා කිරීම සඳහා කළමනාකරණය විසින් කටයුතු කර නොතිබුණි. |
| (ii) | 2013 අප්‍රේල් 10 දිනැති අංක 04/2013 දරන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ආයතන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයන් සිදුකිරීමේදී මාස 06 ක ප්‍රමාදයන් නිරීක්ෂණය විය. |

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම්වලින් වූ ප්‍රතිඵලය රු.443,649,262 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.197,158,693 ක් වූයෙන් සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයේ රු.246,490,569 ක තවදුරටත් පිරිහීමක් දැක්වුණි. පුද්ගලික පඩිනඩි, ගිවිසුම්ගත සේවා සහ වෙනත් මෙහෙයුම් වියදම් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ මෙහෙයුම්වල ප්‍රතිඵලය රු.443,649,262 ක ඌනතාවයක් වුවද එකතුව රු.2,342,036,986 ක් වූ පුද්ගලික පඩිනඩි, රජයට ගෙවන ලද බදු හා ක්ෂය සැලකිල්ලට ගැනීමෙන් පසු සමාලෝචිත වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ අගය එකතු කිරීම රු.1,898,387,724 ක් විය. තවද, පෙර වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය සඳහා අගය එකතු කිරීම රු.52,035,162 කින් හෙවත් සියයට 3 කින් වැඩි වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

--------------------------------

### 4.1 අධ්‍යයන කාර්යසාධනය

--------------------------

සමාලෝචිත වර්ෂය තුළ විශ්ව විද්‍යාලයේ අධ්‍යයන කාර්ය සාධනය පහත පරිදි වේ.

(අ) විභාග ප්‍රතිඵල

-----------------

1995 ජුලි 14 දිනැති අංක 636 දරන විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා චක්‍රලේඛය අනුව, විභාග පැවැත්වීමෙන් පසු මාස 3 ක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කළ යුතුය. කෙසේ වුවද විශ්ව විද්‍යාලයේ එක් එක් පීඨයන් යටතේ පවත්වන විවිධ පාඨමාලා සඳහා විභාග පැවැත්වීමේ දිනයන් හා විභාග ප්‍රතිඵල නිකුත් කිරීමේ ඉලක්ක දිනයන් තීරණය කර නොතිබුණි. 2017 හා 2018 වර්ෂයන් තුළ විශ්වවිද්‍යාලයේ කලා, කළමනාකරණ අධ්‍යයන හා වාණිජ, විද්‍යා, AHS ඒකකය/ වෛද්‍ය රසායනාගාර විද්‍යාව, AHS ඒකකය/ හෙද සේවය, AHS ඒකකය/ ඖෂධවේදය සහ අධ්‍යාපන පශ්චාත් උපාධි ඩිප්ලෝමා යන පීඨයන්හි ප්‍රතිඵල නිකුත් කිරීමේදී මාස 04 සිට මාස 12 දක්වා සැලකිය යුතු කාල පරිච්ඡේදයක ප්‍රමාදයන් තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය. එබැවින් නියමිත කාලය තුළදී ශිෂ්‍යයින්ට රැකියා අවස්ථාවන් ලබා ගැනීමේ හැකියාව අහිමි වී තිබුණි. මෙම කරුණ මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවලින්ද පෙන්වා දී තිබුණද, විභාග පවත්වා මාස 3 ක් ඇතුළත ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා අදාළ අධිකාරීන් විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) පුස්තකාල පරිපාලනය

---------------------

පෙර වර්ෂවල මිලදී ගත් එ.ජ.ඩො.951,597 ක් වටිනා වාර සඟරා 2018 ඔක්තෝබර් 05 දින වන විටත් විශ්වවිද්‍යාලයට ලැබී නොතිබුණි.

(ඇ) ශිෂ්‍ය අධ්‍යයන වැඩසටහන්

---------------------------------

න්‍යායාත්මක හා ප්‍රායෝගික සැසිවලට අදාළ පැය 1,847 කින් පැය 491 ක් කෘෂිකර්ම පීඨයේ අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා ආවරණය කර නොතිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලය ශ්‍රේණිගත කිරීම

--------------------------------

"වෙබොමෙට්රික්ස්" (Webometrics) විසින් ප්‍රසිද්ධ කරන ලද ලෝක ශ්‍රේණිගත කිරීමට අනුව, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල සහ ජාත්‍යන්තර විශ්වවිද්‍යාල අතරින් පිළිවෙලින් 7 වන ස්ථානය හා 4506 වන ස්ථානය සඳහා 2017 වර්ෂයේදී මෙම විශ්වවිද්‍යාලය ශ්‍රේණිගත වී ඇත. පෙර වර්ෂයේදී එය 8 වන ස්ථානය හා 5380 වන ස්ථානය හිමිකරගෙන තිබුණි. කෙසේ වුවද, දේශීයව හා ජාත්‍යන්තරව විශ්වවිද්‍යාල ශ්‍රේණිගත කිරීම වැඩිදියුණු කර ගැනීම සඳහා තවදුරටත් කටයුතු කිරීම අවශ්‍ය වනු ඇත.

### 4.2 කළමනාකරණ කාර්යයන්

----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශිෂ්‍යත්ව මත විදේශගත වූ විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් 73 දෙනෙකු ශිෂ්‍යත්ව සම්පූර්ණ කිරීමෙන් පසු රාජකාරී සඳහා වාර්තා කර හෝ විශ්වවිද්‍යාලයෙන් ඉවත්වීම හෝ සිදුකර නොතිබුණි. කෙසේ වුවද, ගිවිසුම් කඩ කිරීම වෙනුවෙන් 2017 දෙසැම්බර් 31 දිනට ඔවුන්ගෙන් අයවිය යුතු බැඳුම්කර වටිනාකම එකතුව රු.මිලියන 68.4 ක් අයකර ගැනීමට විශ්වවිද්‍යාලය කටයුතු කර නොතිබුණි.

(ආ) විශේෂිත සිසුන් වෙනුවෙන් පරිත්‍යාග ශිෂ්‍යත්ව අරමුදලකට ගෙවීම සඳහා වැඩපිළිවෙලක් සකස් කිරීමට විශ්වවිද්‍යාලයට නොහැකි වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 2017 වර්ෂයේ දී සිසුන් 116 දෙනෙකු සඳහා පරිත්‍යාග ශිෂ්‍යත්ව මුදල් රු.191,760 ක් ගෙවා නොතිබුණි.

(ඇ) සමීක්ෂණ මණ්ඩල පැවැත්වීම සඳහා පත්කරන ලද කමිටුව විසින් විගණනයට ඉදිරිපත් කරන ලද සමීක්ෂණ වාර්තාවල නිෂ්කාර්ය අයිතමයන් 5890 ක් හා අලුත්වැඩියා කළ නොහැකි අයිතමයන් 6080 ක් පිළිබඳව වාර්තා කර නොතිබුණි.

(ඈ) 2016 වර්ෂය සඳහා සමීක්ෂණ මණ්ඩල වාර්තාවල වාර්තා කරන ලද හානි වූ විෂයයන් 3118 ක් හා අලුත්වැඩියා කළ නොහැකි විෂයයන් 8388 ක් පිළිබඳව විශ්වවිද්‍යාලයේ කළමනාකරණය විසින් විධිමත් පියවර ගෙන නොතිබුණි.

## 4.3 නිෂ්කාර්ය හා ඌන උපයෝජිත වත්කම්

-----------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 03 සිට 19 දක්වා කාලපරිච්ඡේදයක් තුළ විශ්වවිද්‍යාලයේ ගබඩා I හා II හි වටිනාකම රු.1,219,402 ක් වූ නිෂ්කාර්ය, අලුත්වැඩියා කළ නොහැකි හා සෙමින් චලනය වන විෂයයන් පැවතුණි. කෙසේ වුවද, මේ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාලය විසින් කඩිනම් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ආ) රු.මිලියන 192.36 ක් වටිනා ගොඩනැගිලි ඉදිකිරීම් වැඩ නිමකර කළමනාකරණ අධ්‍යයන හා වාණිජ පීඨයට භාර දී තිබුණද, එම ගොඩනැගිල්ල වර්ෂ 3 කට වැඩි කාලයක් නිෂ්කාර්යව තිබෙන්ට ඉඩහැර තිබුණි.

## 5. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීම

---------------------------------------------

විශ්වවිද්‍යාලය විසින් 2030 වර්ෂය සඳහා තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳ න්‍යාය පත්‍රය පිළිබඳ දැනුවත් නොවීම හේතුවෙන් එම අරමුණු හා ඉලක්ක ඉටුකර ගැනීම සඳහා විශ්වවිද්‍යාලයේ කාර්යයන්ට අදාළව තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක සංවර්ධනයේ වැදගත් අවස්ථාවන් සහිතව හඳුනාගැනීමට පියවර ගෙන නොතිබුණි.

## 6. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

## 6.1 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

------------------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ

(අ) 2014 සිට 2016 දක්වා කාලපරිච්ඡේදය තුළ විවිධ ඉදිකිරීම් හා පුනරුත්ථාපන වැඩ සඳහා ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට ගෙවන ලද එකතුව රු.29,611,788 ක් වූ අත්තිකාරම්, වැඩ නිමකර වර්ෂ 02 කට වැඩි කාලයක් ගතවීමෙන් පසුවත් නිරවුල් කර නොතිබුණි.

(ආ) වවුනියා මණ්ඩපයේ සේවක නිල නිවාස ඉදිකිරීම සඳහා 2017 අප්‍රේල් මාසයේදී ගොඩනැගිලි දෙපාර්තමේන්තුවට රු.මිලියන 25 ක අත්තිකාරමක් ගෙවා තිබුණි. ගිවිසුම අනුව, 2017 දෙසැම්බර් 31 දිනට හෝ ඊට පෙර වැඩ නිමකළ යුතුවිය. කෙසේ වුවද, 2018 සැප්තැම්බර් 30 වන විටත් වැඩ නිමකර නොතිබුණි.

## 6.2 අයවැය පාලනය

අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

## 6.3 වාර්ෂික වාර්තාව සභාගත කිරීම

2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය ප්‍රකාරව 2016 වර්ෂය සඳහා වාර්ෂික වාර්තාව 2018 ජූලි 31 වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6.4 පෙර විගණන වාර්තාවලින් පෙන්වා දුන් නොවිසඳුණු කරුණු

(අ) සියලුම කාර්ය මණ්ඩලය ඔවුන්ගේ පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍රයේ සටහන් කළ යුතුය. කෙසේ වුවද, බොහෝ නිලධාරීන් තම පැමිණීම හා පිටවීම ඇඟිලි සලකුණු සටහන් යන්ත්‍රයේ ඇතුළත් කිරීම ප්‍රතික්ෂේප කර තිබුණි. ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරීගේ රීති, රෙගුලාසි හා නියෝග විශ්වවිද්‍යාලයට අනුයුක්ත සියලුම කාර්ය මණ්ඩලය විසින් අනුගමනය කළ යුතු බවට මේ සම්බන්ධයෙන් 2017 නොවැම්බර් 23 දින පැවැත් වූ රාජ්‍ය ව්‍යාපාර කාරක සභාව විසින් නියෝග කරන ලදී. කෙසේ වුවද, මෙම වාර්තාවේ දිනය දක්වාම මේ සම්බන්ධයෙන් වූ නියෝග විශ්වවිද්‍යාලය විසින් අනුගමනය කර නොතිබුණි.

(ආ) පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති රු.357,400 ක් වටිනාකම වූ පාඩු පිළිබඳව 2017 දෙසැම්බර් 31 වන විටත් කටයුතු කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලන

පද්ධති හා පාලන පිළිබඳ නිරීක්ෂණය වූ අඩුපාඩු විශ්වවිද්‍යාලයේ උපකුලපතිවරයාගේ අවධානයට වරින්වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | වත්කම් කළමනාකරණය | වත්කම් කාර්යක්ෂමව භාවිතා කිරීම සඳහා අවධානය යොමු කිරීම. |
| (ආ) | මානව සම්පත් කළමනාකරණය | අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පවත්නා පුරප්පාඩු පිරවීම සඳහා විධිමත්ව කටයුතු කිරීම හා මානව සම්පත්වල තථ්‍ය අවශ්‍යතා සැලකිල්ලට ගෙන පවත්නා කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීම. |
| (ඇ) | වාහන සංචිතය කළමනාකරණය | ගමන් පිළිබඳ අරමුණ, ඉන්ධන ඇණවුම් අංක, දිනය හා ඉන්ධන බිල්පත්වල අංක ධාවන වාර්තාවල සඳහන් කළ යුතුවීම. |
| (ඈ) | ගිණුම්කරණය | මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී නියමිත ආකෘතිය යොදාගත යුතු වීම. |
| (ඉ) | ගබඩා පරිපාලනය | ගබඩා විෂයයන් ක්‍රමානුකූලව උපයෝජනය කිරීම සඳහා කළමනාකරණය විසින් අර්ථවත් ක්‍රියාමාර්ග ගැනීම. |